**විශ්‍රාමික උපලේඛණගත රජයේ නිලධරයන් (අධිකරණ ලිපිකරු/ අධිකරණ ලඝු ලේඛක / අධිකරණ යතුරු ලේඛක) කොන්ත්‍රාත් පදනම මත සේවය සඳහා බඳවා ගැනීම.**

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ, අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ, සේවය කර දැනට විශ්‍රාම ගන්වා ඇති අධිකරණ ලිපිකරු / අධිකරණ ලඝු ලේඛක/අධිකරණ යතුරු ලේඛක යන සේවා වල නිලධරයන් විශ්‍රාම ගන්වනු ලැබූ අවස්ථාවේ දැරූ තනතුරට 2018.06.01 දින සිට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කරනු ලබන කාල සීමාවක් සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවාගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

02. සම්මුඛ පරීක්ෂණයකින් තෝරාගනු ලබන පහත සුදුසුකම් සහිත අයදුම්කරුවන් පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කයක පිහිටි අධිකරණයක සේවය කිරීම සඳහා බඳවාගනු ලැබේ.

I. 2019.05.31 දින වනවිට වයස අවුරුදු 67 නොඉක්මා විය යුතුය.

II. මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය.

III. විනය හේතුවක්, අකාර්යක්ෂමතාවක්, අසතුටුදායක සේවය වැනි හේතුවක් මත විශ්‍රාම ගන්වා නොතිබිය යුතුය.

IV. ඉල්ලුම්පත් කැඳවන දිනට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය පනතේ 12 වන වගන්තිය යටතේ විශ්‍රාම ගන්වා නොතිබිය යුතුය.

V. විශ්‍රාම ලැබීමට පෙර සක්‍රීය සේවා කාලය සතුටු දායක විය යුතු අතර විනය දඬුවම් ලබා නොතිබිය යුතුය.

03. 2018.04.10 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 416 හි සඳහන් පරිදි කොන්ත්‍රාත් කාලය සඳහා වැටුප් සහ දීමනා ගෙවනු ලැබේ.

04. ඒ අනුව ඉහත සඳහන් තනතුරක සේවය කර විශ්‍රාම ගොස් ඇති නිලධරයන් කොන්ත්‍රාත් පදනම මත සේවය කිරීමට කැමති නම් මේ සමග අමුණා ඇති ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කර ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12. ලිපිනයට 2018.05.11 දිනට පෙර ඉදිරිපත්කල යුතුය. ඉල්ලුම්පත්‍රය සමග අයදුම්කරුගේ නම සහ ලිපිනය ලියන ලද රු. 40.00 මුද්දර ඇලවූ 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් එවිය යුතුය.

05. ඉල්ලුම්කරන විශ්‍රාමික නිලධරයන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගැනීම සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වනු ඇත.

එච්.එස්.සෝමරත්න
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2018 අප්‍රේල් මස 16 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

ඇමුණුම

පෞද්ගලික ලිපිගොනු අංකය:

| EA | PF | | |
|---|---|---|---|

<u>විශ්‍රාමික උපලේඛණගත රජයේ නිලධරයන් (අධිකරණ ලිපිකරු / අධිකරණ ලඝු ලේඛක /</u>

<u>අධිකරණ යතුරු ලේඛක ) කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගැනීම සඳහා වන ආදර්ශ අයදුම්පත්‍රය.</u>

1. මුලකුරු සමග නම :-........................................................................ (මයා/මිය/මෙනවිය)
2. මුලකුරු වලින් හැඳිනවෙන නම් :-..........................................................................................
..........................................................................................................................
3. උපන් දිනය :-..............................................
4. 2019.05.31 දිනට වයස :- අවු. .................... මාස . .................... දින..........................
5. පෞද්ගලික ලිපිනය :-...................................................................................................
..........................................................................................................................
6. දුරකථන අංකය :- ස්ථාවර.................................. ජංගම...................................................
7. විශ්‍රාම යන අවස්ථාවේ දැරූ තනතුර හා ශ්‍රේණිය :-..........................................................................
8. (I) විශ්‍රාම ගන්වන ලද දිනය :- ...........................................................
   (II) විශ්‍රාම ගන්වන ලද දිනට වයස :- ...........................................................
9. විශ්‍රාම යන අවස්ථාවේ සේවය කල අධිකරණය :- ...........................................................
10 (I) මීට පෙර කොන්ත්‍රාත් සේවයේ යොදවා ගෙන ඇතිද යන වග:-...........................................
   (II) ඇත්නම් එම කාලය :-...........................................................
11. සේවය කිරීමට කැමති දිස්ත්‍රික්ක 03 ක් අනුපිළිවෙලින් දක්වන්න:-
   (I)..........................................
   (ii)..........................................
   (iii)..........................................
12. (I) විශ්‍රාම ගන්නා ලද අවස්ථාවේ ලබමින් සිටි වැටුප් පරිමාණය :-..................................................
   (ii). විශ්‍රාම ගන්නා ලද අවස්ථාවේ ලබමින් සිටි මාසික වැටුප:-..................................................
   (වැටුප් විස්තරයකින් සනාථ කල යුතුය)

මා විසින් ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ඉහත දක්වන ලද දිස්ත්‍රික්කයක පිහිටි අධිකරණයක කොන්ත්‍රාත් පදනමින් සේවය කිරීමට කැමති බවත් දන්වා සිටිමි.මෙ සමග මාගේ නම සහ ලිපිනය ලියන ලද රු.40ක මුද්දර අලවන ලද 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් අමුණා එවමි.

..................................
අයදුම්කරුගේ අත්සන

දිනය :- ..................................